සැ. යු. - 2024.05.31 දින පළ කරන ලද අංක 2387 ගැසට් පත්‍රයේ I:I සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,388 - 2024 ජුනි මස 07 වැනි සිකුරාදා - 2024.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1624 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1625 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1633 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1635 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1637 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජුනි මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට්* පත්‍රයේ දැන්වීම් 2024 ජුනි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට්* පත්‍රය *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1623 - B 82577 - 5,403 (2024/06)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**රාත්තල් 80 කොන්ක්‍රීට් සිල්පරවලට ගැළපෙන රබර් පෑඩ් 200,000 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

1. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයට රාත්තල් 80 කොන්ක්‍රීට් සිල්පරවලට ගැළපෙන රබර් පෑඩ් 200,000 ක් මිල දී ගැනීම සඳහා දේශීය නිෂ්පාදකයින් වෙතින් ජාතික තරගකාරී ලංසුකරණ පදනම මත මුද්‍රා ලංසු කැඳවනු ලැබේ.

2. ලංසු භාර ගැනීම **2024.06.20 දින ප.ව. 2.00** ට අවසන් කෙරේ.

3. ආපසු නොගෙවන රු. 13,950.00 (රුපියල් දහතුන් දහස් නවසිය පනහක) ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, **2024.06.19 දින ප.ව. 3.00** දක්වා, කොළඹ 10 ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.

4. ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගීවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

5. ලංසුකරණ ලිපිලේඛනයෙ හි සඳහන් කර ඇති පරිදි රු. 600,000.00 (රුපියල් හයලක්ෂයක) වටිනාකමක් ඇති ලංසු සුරක්ෂණයක් ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

6. මුද්‍රා තැබූ ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. *නැතහොත්* අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

7. ලංසුකරණ ලිපිලේඛන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂාකර බැලිය හැකි අතර, වැඩි විස්තර සඳහා අමතන්න.

| | | |
|---|---|---|
| දුරකතන අංකය | : | +94(11) 2438078 හෝ +94(11) 2436818 |
| ෆැක්ස් අංකය | : | +94(11) 2432044 |
| ඊමේල් | : | srs.slr@gmail.com / tender2@railway.gov.lk |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.8002

06 - 18

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල**

කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවලට අදාළ ව රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ හා හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ වර්ෂ **2024 ක් වූ ජුනි මස 25 වැනි අඟහරුවාදා දින මධ්‍යාහ්න 12.00 ට** කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියෙහි විකුණනු ලැබේ.

මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ සඳහා හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසි ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුයි.

අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය පැවැත්වෙන දින **පෙ.ව. 11.00 - පෙ.ව 11.30** තෙක් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකිය.

අධිකරණය මගින් ඉදිරිපත් කරන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන් හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුය.

වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එදිනම **ප.ව. 4.00** ට පෙර මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසි භූමියට පැමිණෙන පුද්ගලයින් ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල.

2024 මැයි මස 21 වැනි දින,
කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01 | 30357/24 | i. ගෑස් සිලින්ඩර 01 (5kg)<br>ii. රෙගියුලේටරය සහිත ලිප් 01 (වට 04) |
| 02 | 4239/16 | i. ගෑස් සිලින්ඩර 01 (12.5kg)<br>ii. රෙගියුලේටරය සහිත ලිප් 01 (වට 04) |
| 03 | 36743/20 | i. ගෑස් සිලින්ඩර 01 (2.3kg)<br>ii. රෙගියුලේටරය සහිත ලිප් 01 (වට 02) |
| 04 | 27561/23 | i. ගෑස් සිලින්ඩර 01 (12.5kg)<br>ii. රෙගියුලේටරය සහිත ලිප් 01 (වට 03) |
| 05 | 35398/20 | i. ගෑස් සිලින්ඩරය (12.5kg)<br>ii. ගෑස් ලිප් 01 (වට 02) |
| 06 | 25692/23 | i. ගෑස් සිලින්ඩර 01 (12 kg)<br>ii. ගෑස් සිලින්ඩර 01 (12.5kg) |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 07 | 31287/24 | ගෑස් ලිප් 01 (වට 02) |
| 08 | 28020/23 | i. ගෑස් සිලින්ඩරය (5kg)<br>ii. ගෑස් ලිප් 01 (වට 04) |
| 09 | 30561/24 | ගෑස් ලිප් 01 (වට 02) |
| 10 | 31757/24 | i. ගෑස් ලිප් 01 (වට 03)<br>ii. ගෑස් සිලින්ඩර් 01 (12.5kg)<br>iii. ඇලුමිනියම් මුට්ටි 01 |
| 11 | 32480/24 | i. ඇලුමිනියම් මුට්ටි 01<br>ii. ඇලුමිනියම් හිල් මුට්ටි 01<br>iii. ගෑස් ලිප් 01 (වට 04)<br>iv. ගෑස් සිලින්ඩර 01 (2.3kg) |
| 12 | 33121/24 | i. ගෑස් ලිප් 01 (වට 02)<br>ii. ගෑස් සිලින්ඩර 01 (12.5kg) |
| 13 | 33144/24 | i. ගෑස් ලිප් 01 (වට 03)<br>ii. ගෑස් සිලින්ඩර 01 (5kg)<br>iii. හිල් මුට්ටි 01<br>iv. මුට්ටි 01 |
| 14 | 30546/24 | i. හිල් මුට්ටි 01<br>ii. ඇලුමිනියම් මුට්ටි 01 |
| 15 | B/6898/23 | i. යකඩ ඉනි 02<br>ii. යකඩ කටු 01<br>iii. සවල් 02<br>iv. උදළු 01<br>v. මිටි 01 |
| 16 | 26959/23 | මල්ටි ප්ලග් 01 |
| 17 | 4483/23 | සවල් 01 |
| 18 | 29582/24 | සවල් 01 |
| 19 | 26138/23 | සවල් 01 |
| 20 | 26952/23 | විදුලි පන්දම් |
| 21 | 27446/23 | විදුලි පන්දම් |
| 22 | 30410/24 | විදුලි පන්දම් |
| 23 | 32939/24 | විදුලි පන්දම් 01 (Chargeable) |
| 24 | 29821/24 | සවල් 01 |
| 25 | 29810/24 | සවල් 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 26 | 30297/24 | සවල් 01 |
| 27 | 30278/24 | සවල් 01 |
| 28 | 32189/24 | ඩිජිටල් තරාදිය |
| 29 | 31621/24 | i. නයිලෝන් ලණු ඉනිමග<br>ii. වතුර මෝටරය<br>iii. යකඩ බාල්දි 03<br>iv. ප්ලාස්ටික් තාච්චි 01<br>v. අලවංගු 02<br>vi. උදලු 02 යි<br>vii. යකඩ බොලොක්ක 02 යි<br>viii. යකඩ මිටි 01 යි |
| 30 | AR 8840/24 | වැසිකිළි උපාංග කට්ටල 01 (කොමඩ් 01) |
| 31 | AR 8839/24 | i. ප්ලාස්ටික් පුටු 04<br>ii. වතුර මෝටර් 01<br>iii. පිගන් කට්ටල 01 |

06 - 01

---

### මහෙස්ත්‍රාත් අධිකරණය - අක්කරපත්තුව

අක්කරපත්තු මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2024

01. අක්කරපත්තු මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් නඩු භාණ්ඩ **2024.06.15** වැනි දින පෙ.ව. **9.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

05. සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතු වන අතර චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසි භූමියට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

ඒ. සී. රිස්වාන්,<br>
මහෙස්ත්‍රාත්,<br>
මහෙස්ත්‍රාත් අධිකරණය - අක්කරපත්තුව.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ | එකතුව |
|---|---|---|---|
| 01 | 63518/PC/22 | යතුරු පැදිය EP BAD 6565 | 01 |
| 02 | අංක නැත | අත් ට්‍රැක්ටර් | 02 |
| 03 | අංක නැත | යතුරු පැදිය | 01 |
| 04 | අංක නැත | යතුරු පැදිය EP JU 3664 | 01 |
| 05 | අංක නැත | යතුරු පැදිය (Hunk) | 01 |
| 06 | අංක නැත | යතුරු පැදිය (TVS) | 01 |
| 07 | අංක නැත | යතුරු පැදිය (Pulsar) | 01 |
| 08 | අංක නැත | යතුරු පැදිය (CD Dawn) | 01 |
| 09 | AR/2577/23 | යතුරු පැදිය EP TD 5289 | 01 |
| 10 | AR/2577/23 | යතුරු පැදිය EP MN 7058 | 01 |
| 11 | AR/2577/23 | යතුරු පැදිය WP VL 0849 | 01 |
| 12 | AR/2577/23 | යතුරු පැදිය NW TV 0096 | 01 |
| 13 | 63711/PC | ට්‍රක් වාහනය (Bolero) LP DAG 1214 | 01 |

06 - 07

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - ත්‍රිකුණාමලය**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2024.06.29

ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කර ඇති හෝ හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2024.06.29 වැනි දින පෙ.ව. 09.00 ට** ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු සිටී නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩයන් පරීක්ෂා කර බැලිය හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා මුදල් මගින් පමණක් මිල ගෙවිය හැකි අතර චෙක්පත් භාරගනු නොලැබේ. අදාළ වෙන්දේසි භාණ්ඩ මිල දී ගත් පසු එම අවස්ථාවේ දී ම වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

05. ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය වැනි පිළිගත හැකි අනන්‍යතා පත්‍රයක් රැගෙන පැමිණිය යුතුය.

06. ප්‍රසිද්ධ වෙන්දේසියෙන් වැලි ලබාගතහොත් බැකෝ යන්ත්‍ර මගින් අදාළ වැලි අධිකරණ භූමියෙන් කඩිනමින් ඉවත් කරගත යුතුය.

අයි. පී. රසාක්,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය - ත්‍රිකුණාමලය.

2024 මැයි මස 27 වැනි දින,
ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු භාණ්ඩ* | *නඩු අංකය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | ධීවර උපකරණ (දැල් කැබැල්ලක්, පාවෙන උපකරණ හා ලණු) | - | - |
| 02 | ධීවර කටයුතු සඳහා වැඩිදුර භාවිත කරන රියම් | - | - |
| 03 | කණ්ණාඩි ධීවර බෝට්ටුව | - | - |
| 04 | කණ්ණාඩි ධීවර බෝට්ටුව | - | - |
| 05 | කණ්ණාඩි ධීවර බෝට්ටුව | - | - |
| 06 | ෆයිබර් බෝට්ටුව | - | - |
| 07 | ෆයිබර් බෝට්ටුව | - | - |
| 08 | ෆයිබර් බෝට්ටුව | - | - |
| 09 | ෆයිබර් බෝට්ටුව | - | - |
| 10 | ෆයිබර් බෝට්ටුව | - | - |
| 11 | ෆයිබර් බෝට්ටුව | - | - |
| 12 | ෆයිබර් බෝට්ටුව | - | - |
| 13 | ෆයිබර් බෝට්ටුව | - | - |
| 14 | බෝට්ටු එංජිම | - | - |
| 15 | බෝට්ටු එංජිම | - | - |
| 16 | ඩීසල් බෝට්ටු එංජිම | - | - |
| 17 | ඩීසල් බෝට්ටු එංජිම | - | - |

| අනු. අංකය | නඩු භාණ්ඩ | නඩු අංකය | ප්‍රමාණය |
|---|---|---|---|
| 18 | බෝට්ටු එංජිම | MC 2132/2012 | - |
| 19 | බෝට්ටු එංජිම | BR 511/02/21 | - |
| 20 | බෝට්ටු එංජිම | - | - |
| 21 | ෆයිබර් ඔරුව | - | - |
| 22 | ෆයිබර් ඔරුව | - | - |
| 23 | ෆයිබර් බෝට්ටුව | - | - |

**හිමිකරුවෙකු නොමැති ත්‍රීරෝද රථය**

| අනු. අංකය | නඩු අංකය | වාහන අංකය |
|---|---|---|
| 01 | MC 4256/21 | YY 2197 |

**වැලි**

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ගංගා වැලි | කියුබ් 27 |

06 - 19

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - ත්‍රිකුණාමලය**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2024.06.29

ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කර ඇති හෝ හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2024.06.29** වැනි දින පෙ.ව. **09.00** ට ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු සිටී නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩයන් පරීක්ෂා කර බැලිය හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා මුදල් මගින් පමණක් මිල ගෙවිය හැකි අතර චෙක්පත් භාරගනු නොලැබේ. අදාළ වෙන්දේසි භාණ්ඩ මිල දී ගත් පසු එම අවස්ථාවේ දී ම වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

05. ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය වැනි පිළිගත හැකි අනන්‍යතා පත්‍රයක් රැගෙන පැමිණිය යුතුය.

අයි. පී. රසාක්,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය - ත්‍රිකුණාමලය.

2024 මැයි මස 29 වැනි දින,
ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**හිමිකරු නොමැති රන් භාණ්ඩ**

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ කුවිතාන්සි අංකය | භාණ්ඩය | කැරට් | බර (ග්‍රෑම්) | ශුද්ධ බර (ග්‍රෑම්) | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 01 | BR/5765/00 | PR/16/00 | කරමාලය | 20 | 12.3 | | |
| 02 | BR/4466/99 | PR/119/99 | ජිමික්කි - 2<br>කරාබු සෙට්- 1<br>මුදු - 01 | 19 | 7.6 | | |
| 03 | BR/1073/02 | PR 164/02 | වළලු 02 | 12 | 15.7 | | |
| 04 | BR/1999/03 | PR/189/03 | රන් දම්වැල | 22 | 4.1 | | |
| 05 | AR/1275/03 | PR/143/03 | රන් දම්වැල් - 01<br>මුතු රන් දම්වැල් 01 | 21<br>20 | 5.5<br>17.6 | 10 | |
| 06 | MC/7786/94 | PR/37/94 | මුදු | 20 | 1.8 | | |
| 07 | AR/1275/03 | PR/143/03 | රන් දම්වැල් | 22 | 15.3 | | |
| 08 | BR/5687/00 | PR/162/00 | ගල් සහිත මුදු - 02 | 16 | 2.8 | 2.4 | |
| 09 | Mc/18920/99 | PR/148/99 | රන් පටියක් | 16 | 12.3 | | |
| 10 | BR/6269/00 | PR/143/00 | කැඩුණු රන් දම්වැල | 20 | 2.9 | | |
| 11 | BR/771/01 | PR/162/01 | මුදු - 01 | 18 | 2.2 | | |
| 12 | MC/12036/03 | PR/69/02 | කැඩුණු රන් දම්වැල | 22 | 4.3 | | |
| 13 | AR/1368/03 | PR/67/03 | මුදු - 01<br>කරාබු - 01<br>රන් මුදු - 01 | 16 | 2.5 | 1.5 | |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ කුවිතාන්සි අංකය | භාණ්ඩය | කැරට් | බර (ග්‍රෑම්) | ශුද්ධ බර (ග්‍රෑම්) | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 14 | AR/573/10 | PR/14/10 | අත් පළඳනා | 18 | 4.7 | | |
| 15 | MC/1251/01 | PR | මාල පෙත්ත | 20 | 0.8 | | |
| 16 | MC/1272/91 | PR/199/90 | ජිප්සි කට්ටල 01 | 16 | 1.2 | | |
| 17 | MC/23768/01 | PR/57/00 | කැඩුණු රන් දම්වැල | 20 | 0.6 | | |
| 18 | MC/11387/99 | PR/86/99 | ළමා මුදු - 02 | 18 | 1.8 | | |
| 19 | BR/5765/00 | PR/93/00 | මාලපෙත්ත | 16 | 1 | | |
| 20 | MC/15825/98 | PR/107/97 | කැඩුණු මාල පෙත්ත | 16 | 0.4 | | |
| 21 | MC/9236/99 | PR/17/98 | කැඩුණු රන් දම්වැල | 16 | 1.6 | | |
| 22 | AR/113 | PR/07 | මුදු | 20 | 3.4 | | |
| 23 | BR/771/01 | PR/163/01 | මුදු | 18 | 1.2 | | |
| 24 | MC/3667/94 | PR | මාලපෙත්ත | 18 | 2.2 | | |
| 25 | MC/13975/87 | PR/131 | ළමා මුදු | 18 | 0.4 | | |
| 26 | MC/13362/86 | PR | ජිප්සි - කට්ටල 01 | 16 | 2.1 | | |
| 27 | | PR/21/01 | ළමා ජිප්සි කට්ටල 01 | 16 | 0.7 | | |
| 28 | | PR/12/94 | කරාබු - කට්ටල 01 | 10 | 0.4 | | |
| 29 | | PR/123/08 | රන් පටියක්<br>කැඩුණු වළලු<br>කැබැල්ලක් | 16 | 22.7<br><br>1.4 | | |
| 30 | AR/940/07 | PR/162/07 | ගල් සහිත අත් පළඳනා | 20 | 3.7 | 3 | |
| 31 | AR/1279/07 | PR/48/07 | අත් පළඳනා | 20 | 10.3 | | |
| 32 | AR/1895/04 | PR/109/04 | මාල පෙති - 01<br>රන් දම්වැල් - 02<br>මුදු - 01 | 21 | 15.75 | | |
| 33 | AR/998/19 | PR/195/19 | කරාබු කට්ටල 02<br>ළමා මුදු - 02 | 10 | 1.2 | | |
| 34 | AR/3987/09 | | කැඩුණු රන් දම්වැල | 16 | 1 | | |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## 2025 වර්ෂය නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2025 ජනවාරි මස 01 වැනි දින සිට 2025 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයන් හි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට යටත්ව **2024 අගෝස්තු මස 22 වැනි දින පෙ.ව. 10.30** දක්වා නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිල දී ගැනීම සඳහා ඉදිරිපත්වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල මෙම කාර්යාලයට හෝ වෙනත් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සි ද, ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එයට මුද්‍රා තබා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් නාරම්මල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් සඳහා ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන **2024 අගෝස්තු මස 22 වැනි දින පෙ.ව. 10.30** ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාරම්මල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාදය මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින **ප.ව. 3.00** ට පෙර නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. 2025 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබා දීමට හැකි වේදැයි සහතික විය නොහැක. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2025 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව, ටෙන්ඩරය ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා නාරම්මල ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ද ලබාගත යුතු ය.

08. **2024 අගෝස්තු මස 22** වැනි දින රේන්දය විකිණීමෙහි ලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් **2024 සැප්තැම්බර් මස 19 වැනි දින පෙ. ව. 10.30** ට නැවත රේන්ද විකිණීම මෙම ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍යනම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. ආර්. එම්. ඉම්රාන්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාරම්මල.

2024 මැයි මස 22 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* | *රා තැබෑරුම විවෘත කර තබන වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | නාරම්මල | 2024.08.22 දින පෙ. ව. 10.30 ට පෙර | 1,000 | පෙ.ව. 11.00 - ප.ව. 2.00 දක්වා<br>ප.ව. 5.00 - රාත්‍රී 8.00 දක්වා |

06 - 02

---

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම**

2024 ජූලි මස 01 දින සිට 2025 ජුනි මස 30 දින දක්වා

**2024 ජූලි මස 01 දින සිට 2025 ජුනි මස 30** වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට යටත් ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ප්‍රසම්පාදන භාරගනු ලැබේ.

02. සෑම ප්‍රසම්පාදන පත්‍රයක ම ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක පිරවිය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ප්‍රසම්පාදන තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් **කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් 15% ක වටිනාකමින් යුත් වත්කම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.**

03. විධිමත් ලෙස සකස් කරනු ලැබූ සෑම ප්‍රසම්පාදනයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් කෙළවරේ ''අංක ............. දරන ........................ රා තැබෑරුම සඳහා ප්‍රසම්පාදන පත්‍රය'' යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කොට **2024.06.18 වැනි දින ප. ව. 02.30** ට පෙර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. *නැතහොත්* එම වේලාවට පෙර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීම **1982.08.20** දින පළ වී ඇති **අංක 207** දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. **2024.06.18** වැනි දින ප. ව. **02.30** ට ප්‍රසම්පාදන පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ප්‍රසම්පාදනකරුවන් ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්පත් අතුරින් තෝරා ගනු ලබන සාර්ථක ම ගැනුම්කරු විසින් මාස 02කට වැඩි තැන්පතු මුදල සහ එක් මසක බලපත්‍ර ගාස්තුව එදින ම ගෙවිය යුතුය.

07. උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් අතුරින් එකක් හෝ කිහිපයක් **2024.06.18** වැනි දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීම සඳහා **2024 ජුනි මස 20 වැනි දින පෙ. ව. 10.00** දක්වා ප්‍රසම්පාදන පත් භාර ගන්නා අතර, ප්‍රසම්පාදන පත් භාර ගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. මේ සඳහා ද ඉහතින් සඳහන් සියලු කොන්දේසි අදාළ වන බව ද සැළකිය යුතු ය.

08. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

පී. ධනේෂ්වරන්,
ප්‍රාදේශීය ලේකම්,
නගර හා කඩවත් - ත්‍රිකුණාමලය.

2024 මැයි මස 22 වැනි දින,
ත්‍රිකුණාමලය නගර හා කඩවත් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනු අංකය | කොට්ඨාස අංකය | ප්‍රාදේශීය පළාත | විවෘත කරන වේලාව | වසන වේලාව | ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු. | ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු. |
|---|---|---|---|---|---|---|
| 01. | අංක 01 | විල්ලුන්ඩි අංක 01 | පෙ. ව. 11.00 ප. ව. 5.00 | ප. ව. 2.00 ප. ව. 8.00 | 3,000 | 1,000 |
| 02. | අංක 02 | තෙක්කුලුත්තු අංක 03 | පෙ. ව. 11.00 ප. ව. 5.00 | ප. ව. 2.00 ප. ව. 8.00 | 1,500 | 1,000 |

06 - 10

# රජයේ නොවන දැන්වීම්

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9(2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම නම වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැරණි නම : යුනිවර්සල් ලෝටස් කැබ්ස් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 00287952
ලියාපදිංචි කාර්යාලය : අංක 1034/4ඒ, නිසල පෙදෙස, පොතුඅරාව පාර, මාලඹේ.
සමාගමේ අලුත් නම : විල් එන් විල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ නම වෙනස් කළ දිනය : 2024.03.22

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

06 - 35

**මාස් ඒෂියා ඉන්වෙස්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගමේ ලියාපදිංචි අංකය PV 00201557

2007 අංක 07 දරන සමාගම් පනතේ 270 (ඉ) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 272 යටතේ පරිවෘත කිරීමේ නියෝගය

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | මාස් ඒෂියා ඉන්වෙස්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 61/1, පිළියන්දල පාර, කටුවාවල, බොරලැස්ගමුව<br>*සහ*<br>එහි නව ලිපිනය වන අංක 62/31,<br>ජී. පීරිස් මාවත, කලුබෝවිල, දෙහිවල. |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | CHC/63/2023/CO |
| නියෝගය දුන් දිනය | : | 2024 අප්‍රේල් 05 |
| පෙත්සම ඉදිරිපත් කළ දිනය | : | 2023 අගෝස්තු 11 |
| ඇවරකරුගේ නම | : | ජී. ජේ. ඩේවිඩ් |
| ලිපිනය | : | ඇවරකරු,<br>SJMS ඇසෝසියේට්ස් බාරේ,<br>(දැනට ඩිලොයිට් ඇසෝසියේට්ස්)<br>3 වන මහල, අංක 11, කාසල් පටුමග,<br>කොළඹ 04. |

06 - 32/1

---

**මාස් ඒෂියා ඉන්වෙස්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගමේ ලියාපදිංචි අංකය PV 00201557

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඇවරකරුගේ පත්වීමේ දැන්වීම

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | මාස් ඒෂියා ඉන්වෙස්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 61/1, පිළියන්දල පාර, කටුවාවල, බොරලැස්ගමුව<br>*සහ*<br>එහි නව ලිපිනය වන අංක 62/31,<br>ජී. පීරිස් මාවත, කලුබෝවිල, දෙහිවල. |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | CHC/63/2023/CO |
| ඇවරකරුගේ නම | : | ජී. ජේ. ඩේවිඩ් |
| ලිපිනය | : | ඇවරකරු,<br>SJMS ඇසෝසියේට්ස් බාරේ,<br>(දැනට ඩිලොයිට් ඇසෝසියේට්ස්)<br>3 වන මහල, අංක 11, කාසල් පටුමග,<br>කොළඹ 04. |
| පත්වීමේ දිනය | : | 2024 අප්‍රේල් 05 |

06 - 32/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

දෝන මාරි සිල්නට් ඕඩ්රි විජේතුංග
අංක 20/1, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස.

........................ පැමිණිලිකාරිය.

ජෙනානි හසංගිකා විජේතුංග
20, Worplesdon Road, Guildford,
Surrey GUZ 9 R W
ඇටර්නි බලකරු වන ගලකිස්ස ටෙම්ප්ලර්ස් පාර අංක 20/1 දරන ස්ථානයේ පදිංචි වර්ණකුලසූරිය ජෝසප් ලලිත් කුමාර ලොව් මගින් පෙනී සිටී.

2 වන විත්තිකාර ආදේශ පැමිණිලිකාරිය.

නඩු අංකය : 772/17/පී.

*- එදිරිව -*

01. අරෝෂිණී රසංගිකා විජේතුංග
16, Burnham Road, St Albans Hertford Shire
AL. I. 4QW U.K.

02. ජෙනානි හසංගිකා විජේතුංග
20, Worplesdon Road, Guildford, Surrey GUZ 9R W

03. මනෝජ් අසංගික විජේතුංග
01, Nelson Avenue, St. Albans,
Hertford Shire, AL 1, 4QW, U.K.

04. හසංක රජීව විජේතුංග
171, New House Park, St. Albans,
Hertford Shire, AL I, 4QW, U.K.

05. දෝන මාරි සිල්නට් ඕඩ්රි විජේතුංග
අංක 20/1, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස.

(පෙර පැමිණිලිකාරිය)

........................විත්තිකරුවන්.

ඉහත අංක දරන බෙදුම් නඩුවට අදාළ ඉඩම හා ස්ථානය ඉහත නම් සඳහන් මුල් පැමිණිලිකාර 5 වන විත්තිකාරියට හා 1 සිට 4 දක්වා විත්තිකරුවන්ට නඩු තීන්දුවෙ හි දැක්වෙන කොටස් අනුව හිමිකම් ලැබිය යුතු බවට ද, ඔවුන් එමගින් හිමිකම් ලබන බවට ද, එකී නඩුවේ වාර්තා ගත කර ඇති වර්ෂ 2021 ක් වූ ජනවාරි මස 26 වැනි දිනැති අතුරු තීන්දු ප්‍රකාශය මගින් ආඥා කර ඇති හෙයින් ද, එකී අතුරු තීන්දු ප්‍රකාශයේ වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කර ඇති එකී ඉඩම හා ස්ථානය බෙදුම් නඩු පනතේ ප්‍රතිපාදන ප්‍රකාර, විකුණා එකී විකිණීමෙන් ලත් මුදල මෙම නඩුවේ බැරට අධිකරණය වෙත ගෙන ආ යුතු බවට ආඥාකර ඇති හෙයින්ද,

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී ඉඩම හා ස්ථානය ගරු අධිකරණය විසින් අනුමත කරනු ලැබ ඇති විකිණීමේ කොන්දේසිවලට යටත්ව,

**වර්ෂ 2024 ක් වූ ජූලි මස 04 වැනි දින පෙ.ව. 11.00 ට,**

එකී දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*දේපළට පිවිසීම.*- ගල්කිස්ස හන්දියේ සිට ටෙම්ප්ලර්ස් පාරේ කි.මී. 1.5 ක් පමණ ඉදිරියට පැමිණ 1 වන පටුමගින් වමට හැරී මීටර් 100 ක් පමණ ඉදිරියට පැමිණ වමට හැරී මල්ලිකා මාවත දිගේ මද දුරක් ඉදිරියට යන විට වරිපනම් අංක 20/1 දරන දේපළට ළඟා විය හැක. දේපළ පාරේ වම් පැත්තේ පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. (චෙක්පත් භාරගනු නොලැබේ.)

(1) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ක් දේපළ මිල දී ගත් වහාම ගෙවිය යුතු වන අතර ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතුය ;

(2) අදාළ පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු ගැණුම් මිලට 1% ක ගාස්තුව ;

(3) වෙන්දේසිකරුගේ ගාස්තුව ගැණුම් මිලට 2.5% ක්.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන උතුර පිහිටි රත්මලාන ස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. එම්. ආර්. ප්‍රනාන්දු විසින් වර්ෂ 1953.07.01 දින මැන සාදන ලද අංක 418 දරන පිඹුරේ F9 (අංක 46559 දරන හිමිකම් පිඹුරෙන් බෙදා වෙන් කරන ලද) දරන දේපළ නැවත මැන බලයලත් මිනින්දෝරු අනිල් කොල්ලුරේ මහතා වර්ෂ 2019.03.12 දින මැන සාදන ලද අංක 3623 දරන පිඹුරේ කැබලි අංක F9 දරණ දේපළට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | මල්ලිකා මාවත (හිමිකම් පිඹුරේ අංක 46559 හි කැබලි R 14 ද) |
| නැගෙනහිරට | : | හිමිකම් පිඹුරු අංක 46559 හි කැබලි අංක F10 ද, |
| දකුණට | : | හිමිකම් පිඹුරු අංක 46559 හි කැබලි අංක F14 ද, |
| බස්නාහිරට | : | හිමිකම් පිඹුරු අංක 46559 හි කැබලි අංක F8 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් නවයයි දශම එකයි හයක් (පර්. 39.16) ක් විශාල ඉඩම වේ. |

වැඩි විස්තර සඳහා ගල්කිස්ස දිසා අධිකරණයේ අංක 772 දරන බෙදුම් නඩු වාර්තාව බලන්න.

අධිකරණයේ අණ පරිදි,

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු,
(මුළු දිවයිනට ම සාම විනිසුරු).

අංක 59, කුමාරි මාවත,
පටුවත, දොඩන්දූව.
දුරකථන : 0779663420, 0713358434.

06 - 31

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **ජුනි** | 2024.06.07 | සිකුරාදා | 2024.05.22 | බදාදා | දහවල් | 12.00 |
| | 2024.06.14 | සිකුරාදා | 2024.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.20 | බ්‍රහස්පතින්දා | 2024.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.28 | සිකුරාදා | 2024.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2024.07.05 | සිකුරාදා | 2024.06.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.07.12 | සිකුරාදා | 2024.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.19 | සිකුරාදා | 2024.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.26 | සිකුරාදා | 2024.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2024.08.02 | සිකුරාදා | 2024.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.09 | සිකුරාදා | 2024.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.16 | සිකුරාදා | 2024.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.23 | සිකුරාදා | 2024.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.30 | සිකුරාදා | 2024.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.